# මාතලේ රජයේ විද්‍යා විද්‍යාලයේ 10 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කර ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම.

මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ GCP/05/01/06/ළ.ස.ඉ.(වෙළුම) හා 2024.10.07 දිනැති ලිපියට අනුව 2025 වර්ෂයේ සිට 10 ශ්‍රේණියට සිසුන් බඳවා ගැනීමේ නව ක්‍රමවේදයක් අනුමත කර ඇත. ඒ අනුව 2025 වර්ෂයේ සිට මා/රජයේ විද්‍යා විද්‍යාලයට සිසුන් ඇතුළත් කර ගැනීමේ නව ක්‍රමවේදය සම්බන්ධ තොරතුරු පහත සඳහන් වේ.

මෙම විභාගය සඳහා අයදුම්පත් යොමු කළ හැකි මාර්ග වන්නේ

I. ආදර්ශ අයදුම්පත් මා/රජයේ විද්‍යා විද්‍යාලයෙන් ලබා ගෙන සම්පූර්ණ කරන ලද අයදුම්පත් විදුහල්පති, මා/රජයේ විද්‍යා විද්‍යාලය, මාතලේ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කිරීම කළ හැකිය.

II. www.sciencecollegematale.com යන වෙබ් පිටුවෙන් අයදුම්පත්‍රය ලබාගෙන මාර්ගගතව එය සම්පූර්ණ කළ හැකිය.

III. ඉහත කුමන හෝ එක් ක්‍රමයකින් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය විදුහල්පති, මා/රජයේ විද්‍යා විද්‍යාලය, මාතලේ යන ලිපිනය වෙත යොමු කළ යුතු අවසාන දිනය 2024.11.20 වේ.

**මා/රජයේ විද්‍යා විද්‍යාලයට සිසුන් ඇතුළත් කර ගැනීමෙහි ක්‍රමවේදය**

- විභාගයට අදාලව ප්‍රශ්න පත්‍ර සැකසීම, පිළිතුරුපත් ඇගයීම සහ විභාග ප්‍රතිඵල ලේඛන සකස් කිරීම මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන අතර මධ්‍යම පළාත් අධ්‍යාපන ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු විභාග ප්‍රතිඵල ප්‍රසිද්ධ කිරීම සිදු කරනු ලබයි. (මෙයට අදාල සබැඳිය (link) මා/රජයේ විද්‍යා විද්‍යාලයෙහි වෙබ් පිටුවෙන් ප්‍රසිද්ධ කරන අතර විභාග අංකය භාවිතා කිරීමෙන් භාගත (download) කළ හැක.)
- මෙම තරග විභාගය සඳහා ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක පදිංචි විභාගය පවත්වන වර්ෂයේ 9 ශ්‍රේණියේ ඉගෙනුම ලබන ශිෂ්‍ය, ශිෂ්‍යාවන්ට ඉල්ලුම් කළ හැක.
- තෝරා ගැනීමේ තරග විභාගය ගණිතය, විද්‍යාව, සිංහල හා බුද්ධි පරීක්ෂණය ලෙස සිංහල මාධ්‍යය ප්‍රශ්න පත්‍ර 04 කින් සමන් විත වේ. එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා හිමිවන ලකුණු හා කාලය පහත දැක් වේ.

| **විෂයයන්** | **කාලය** | **ලකුණු** |
|---|---|---|
| ගණිතය | පැය 01 යි | 100 |
| විද්‍යාව | පැය 01 යි මිනිත්තු 15 යි | 100 |
| සිංහල | මිනිත්තු 45 යි | 50 |
| බුද්ධි පරීක්ෂණය | මිනිත්තු 45 යි | 50 |
| **මුළු ලකුණු** | | **300** |

- විද්‍යාලයට ඇතුළත් වීමට සුදුසුකම් ලැබීමට විද්‍යාව හා ගණිතය සඳහා එක් එක් විෂයයට අවම වශයෙන් ලකුණු 40 ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.(පහත සඳහන් සියළුම ගණ එනම් කුසලතා ගණය මත/ ආදි ශිෂ්‍යය ගණය මත/ කාර්යය මණ්ඩල ගණය මත/ සහෝදර පදනම මත සඳහා මෙම කොන්දේසිය අදාළ වේ.)

1. පාසලේ 10 ශ්‍රේණිය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම අදාළ වර්ෂයේ නියමිත තරග විභාගයෙන් පමණක් සිදු කරනු ලබයි. වෙනත් කිසිදු අයුරකින් මෙම විදුහලේ 10 හා 11 ශ්‍රේණිවලට සිසුන් ඇතුළත් කරගනු නොලබන අතර එම ඇතුළත් කිරීම **ගණ 04** ක් යටතේ සිදු වේ.

| | |
|---|---|
| 1.1.කුසලතා ගණය මත සිසුන් (විභාග ලකුණු මත පමණක්) | 150 |
| 1.2.ආදි ශිෂ්‍යය ගණය මත සිසුන් | 05 |
| 1.3.කාර්යය මණ්ඩල ගණය මත සිසුන් | 03 |
| 1.4.සහෝදර පදනම මත සිසුන් | 02 |
| **බඳවාගනු ලබන මුළු ශිෂ්‍ය සංඛ්‍යාව** | **160** |

**1.1.කුසලතා ගණය මත තෝරා ගැනීම**

- තරග විභාගයේ කුසලතා අනු පිළිවෙළ අනුව සිසුන් 150 දෙනෙකු බඳවා ගනු ලැබේ.
- අදාළ වර්ෂයේ වැඩිම ලකුණු ලබාගත් ශිෂ්‍යයා/ ශිෂ්‍යයාව ගේ සිට සිසුන් 150 දෙනෙකු තෝරා ගනු ලැබේ.

**1.2.ආදි ශිෂ්‍ය ගණය මත තෝරා ගැනීම**

- මෙම ගණය යටතේ රජයේ විද්‍යා විද්‍යාලයේ ඉගෙනුම ලැබූ ආදි ශිෂ්‍යයයෙකු / ශිෂ්‍යයාවක වශයෙන් ළමයාගේ මව හෝ පියාට තම දරුවා වෙනුවෙන් අයදුම් කළ හැකිය.
- ආදි ශිෂ්‍ය ගණය යටතේ ඉල්ලුම් කිරීමේදී විභාගයට අයදුම් කිරීමේ අවසන් දිනය වන විට ආදි ශිෂ්‍ය සංගමයේ යාවජීව සාමාජිකත්වය ලබා වසර 03 ක් සම්පූර්ණ වී තිබීම අනිවාර්ය වේ.
- ආදි ශිෂ්‍ය සංගමය මඟින් විධිමත්ව ලබා දෙන ලකුණු පමණක් පදනම් කරගෙන සිසුන් 05 දෙනා තෝරා ගනු ලබයි. එසේ ලබා දෙන ලකුණු සංගමයේ පහත නිර්ණායක පදනම්ව තීරණය කරනු ලබයි.

  1.2.1. සාමාජිකත්වය සම්පූර්ණ වසර ගණන අනුව උපරිම ලකුණු 05

  1.2.2. පාසලේ ආදි ශිෂ්‍යය සංගමයේ කටයුතු සඳහා දැක්වූ දායකත්වය සඳහා උපරිම ලකුණු 05

  1.2.3. විෂය සමගාමී ක්‍රියාකාරකම් හා උසස් අධ්‍යාපන සුදුසුකම් මත

    II. විදුහලේ ඉගෙනුම ලබන කාලය තුළ ජාතික මට්ටමෙන් ලබා ඇති ජයග්‍රහණ
      - ප්‍රථම ස්ථානය - ලකුණු 04
      - දෙවන ස්ථානය - ලකුණු 03
      - තෙවන ස්ථානය - ලකුණු 02

    III. විදුහලේ ඉගෙනුම ලබන කාලය තුළ පළාත් මට්ටමෙන් ලබා ඇති ජයග්‍රහණ
      - ප්‍රථම ස්ථානය - ලකුණු 03
      - දෙවන ස්ථානය - ලකුණු 02
      - තෙවන ස්ථානය - ලකුණු 01

    IV. රජයේ පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ප්‍රථම උපාධියක් සඳහා ලකුණු 03 (උපරිම ලකුණු 05)

**1.3.කාර්ය මණ්ඩල ගණය මත තෝරා ගැනීම**

- අයදුම්පත් කැඳවන අවසන් දිනට මා/රජයේ විද්‍යා විද්‍යාලයේ ස්ථිර රජයේ සේවයේ සේවා කාලය වසර 03 ක් සම්පූර්ණ කළ අධ්‍යයන හෝ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ අයෙකුගේ දරුවකු වීම.
- කාර්ය මණ්ඩල ගණය යටතේ සිසුන් බඳවා ගැනීමේදී මූලික සුදුසුකම් ලබූ සිසුන් තිදෙනෙකුට වඩා සිටි අවස්ථාවක දී ඔවුන් තරග විභාගයෙන් ලබාගත් ලකුණු අනුපිළිවෙළ අනුව බඳවා ගැනීම සිදු කරනු ලබයි.

**1.4.සහෝදර ගණය මත තෝරා ගැනීම**

- තරග විභාගය සඳහා අයදුම්පත් කැඳවන දිනට මව්පියන්ගේ වැඩිමහල් දරුවන් දැනටමත් එම පාසලේ ඉගෙනුම ලබමින් සිටීනම් පමණක් මෙම ගණය යටතේ අයදුම් කළ හැකිය.
- 10 ශ්‍රේණියට පාසලට ඇතුළත් වීමේ තරග විභාගයෙන් සමත්ව පාසලට ඇතුළත් වූ සිසුන්ගේ සහෝදර/ සහෝදරියන්ට **පමණක්** මෙම ගණය යටතේ අයදුම් කළ හැකි අතර සාමාන්‍ය පෙළ විභාග ප්‍රතිඵල මත උසස් පෙළ පන්ති සඳහා මෙම පාසලට ඇතුළත් වන සිසුන්ගේ සහෝදර /සහෝදරියන්ට මෙම ගණය යටතේ අයදුම් කිරීමට හිමිකමක් නොමැත.
- සහෝදර ගණය යටතේ සිසුන් බඳවා ගැනීමේදී මූලික සුදුසුකම් ලැබූ සිසුන් දෙදෙනෙකුට වඩා සිටින අවස්ථාවක දී ඔවුන් තරග විභාගයෙන් ලබා ගත් ලකුණු අනුපිළිවෙළ අනුව සිසුන් බඳවා ගනු ලබයි.

02. ඉහත එක් එක් ගණයන් යටතේ සිදු කරන බඳවා ගැනීම්වල දී සමාන ලකුණු ලැබූ සිසුන් කිහිප දෙනෙකු සිටින අවස්ථාවල පහත සඳහන් පියවරයන් අනුගමනය කරනු ලබයි.

  2.1. අදාළ වර්ෂයේ පැවැත් වූ බඳවා ගැනීමේ තරග විභාගයේ ගණිතය හා විද්‍යාව විෂයයන් සඳහා ලබා ගත් ලකුණු පදනම්ව කුසලතාව තීරණය කිරීම.

  2.2. ඉහත 2.1. යටතේ ද ලකුණු සමාන වුයේ නම් අදාළ වර්ෂයේ පැවැත් වූ බඳවැගැනීමේ තරග විභාගයේ ගණිතය, විද්‍යාව හා බුද්ධි පරීක්ෂණය යන විෂයයන් තුනේ ලකුණු එකතුව පදනම්ව අදාළ සිසුවා තෝරා ගැනීම.

  2.3. ඉහත 2.1 හා 2.2 යටතේද කුසලතාව සමාන වූයේ නම් 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ දී ලබා ගත් ලකුණු පදනම්ව කුසලතාව තීරණය කිරීම.

03. ඉහත දැක්වූ සියලුම ගණයන් යටතේ මූලික සුදුසුකම් සපුරා නොමැති වීමෙන් හෝ බඳවාගැනීම් සඳහා නොපැමිණීම් නිසා ඇතිවන පුරප්පාඩු තරග විභාගයේ ප්‍රතිඵල ලේඛනයට අනුව කුසලතා ගණයෙන් අනුපිළිවෙළින් බඳවා ගැනීමට කටයුතු සිදු කරනු ලබයි.

04. ආදි ශිෂ්‍ය, සහෝදර හා කාර්ය මණ්ඩල ගණයන් යටතේ බඳවා ගනු ලබන සිසුන් විභාගයේ කුසලතා අනුපිළිවෙළ අනුව 150 වැනි ස්ථානය ලබා ගන්නා සිසුවාගේ ලකුණු ප්‍රමාණයෙන් 80% ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

..............................

විදුහල්පති (වැ.බ)